# ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව

## තොරතුරු තාක්ෂණ සහකාර තනතුරට බඳවා ගැනීම (බාහිර)

**ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ (TRCSL) ඉහත තනතුරේ පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම් ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

**(1) රැකියා විස්තරය**

- කළමනාකාරිත්වය විසින් නියම කරන ලද පරිදි, අදාළ අංශ/ඒකකවල දත්ත සමුදායන් මෙහෙයවීම, දත්ත ඇතුළත් කිරීම සහ සම්පාදනය කිරීම.
- කළමනාකරුවන් විසින් ලබා දෙන මාර්ගෝපදේශ අනුව පරිගණක වාර්තා, ලිපි සහ අනෙකුත් ලේඛන පිළියෙල කිරීම.
- අදාළ තොරතුරු සහ දත්ත රැස් කිරීම, විශ්ලේෂණය කිරීම සහ වාර්තා කිරීම.
- අංශ/ඒකක මගින් පවත්වාගෙන යා යුතු අන්තර්ජාලය, විද්‍යුත් තැපැල, වෙබ් අඩවි සම්බන්ධතා සහ මාර්ගගත වාර්තා සම්බන්ධයෙන් කටයුතු කිරීම.

**(2) අවශ්‍ය අවම අධ්‍යාපනික/වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද**

ඉංග්‍රීසි, ගණිතය සහ සිංහල/දෙමළ භාෂාව ඇතුළුව විෂයයන් හතරකට සම්මාන සාමාර්ථ සහිතව එකවර අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයෙන් විෂයයන් 06ක් සහ අ.පො.ස. (උසස් පෙළ) විභාගයෙන් විෂයයන් 03ක් සමත් වීම.

සහ

කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික පුහුණු ආයතනයක් විසින් පවත්වනු ලබන, අදාළ ක්ෂේත්‍රයේ N.V.Q මට්ටම 6 ට නොඅඩු ජාතික ඩිප්ලෝමා පාඨමාලාවක් සාර්ථකව සම්පූර්ණ කර තිබීම.

සහ

තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ වසර 05ක පශ්චාත් සුදුසුකම් ලැබීමේ පළපුරුද්ද. අධ්‍යාපන /වෘත්තීය සුදුසුකම් ලබාගැනීමෙන් පසු තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ වසර 05ක පළපුරුද්ද ලබා තිබීම.

**(3) බඳවා ගැනීමේ පටිපාටිය**

ලිඛිත තරඟ විභාගයක සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක කුසලතා ප්‍රතිඵල මත බඳවා ගැනීම් සිදු කරනු ලැබේ. තරඟ විභාගයේ සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ සමස්ත ලකුණු මත ලබාගත් කුසලතා අනුපිළිවෙල මත පමණක් පත්වීම් සිදු කරනු ලැබේ. (I) භාෂා ප්‍රවීණතාවය සහ බුද්ධි පරීක්ෂණය (II) තනතුරට අදාළ විෂය දැනුම ලිඛිත විභාගයේ විෂයයන් වේ .

**(4) වැටුප :-** TRC 8.1 -රු. 59,432 (10x1173) -(10x1564)-(10x1955)-(10x2346) – 129,812

**(5) වයස** : අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවු.18-45 අතර විය යුතුය.

**(6) අයදුම් කිරීමේ ක්‍රමය**

1. අයදුම්පත ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය වන www.trc.gov.lk. වෙතින් බාගත කර ගත හැකිය.
2. නියමිත ආකෘතිය අනුව පිළියෙල නොකරන ලද අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
3. අයදුම්පත් පැහැදිලි සහ කියවිය හැකි විය යුතු අතර, අවශ්‍යතා නොසපුරන අයදුම්පත් සලකා බලනු නොලැබේ
4. සම්පූර්ණ කරන ලද අයදුම්පත් අධ්‍යාපනික/ වෘත්තීය සුදුසුකම් සහතිකවල පිටපත් සහ සේවා පළපුරුද්ද පිළිබඳ විස්තර සමඟ එවිය යුතුය.
5. සියලුම අයදුම්පත් අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතිකවල පිටපත් සහිතව **2025.03.05 දින හෝ එදිනට පෙර** "අධ්‍යක්ෂ ජනරාල් - ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව, අංක 276, ඇල්විටිගල මාවත, කොළඹ 08" යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ " තොරතුරු තාක්ෂණ සහකාර තනතුර සඳහා අයදුම්පත - බාහිර - 2025 " යනුවෙන් සඳහන් කළ යුතුය.
6. අයදුම්පතෙහි ස්කෑන් කරන ලද පිටපතක් අදාළ අධ්‍යාපනික සහ වෘත්තීය සහතික සමඟ careers@trc.gov.lkවිද්‍යුත් තැපෑලට එවිය යුතුය. විද්‍යුත් තැපෑලෙහි මාතෘකාව " **තොරතුරු තාක්ෂණ සහකාර තනතුරට බඳවා ගැනීම -බාහිර - 2025**" විය යුතුය.
7. රජයේ ආයතනවල සේවය කරන අයදුම්කරුවන් සිය අයදුම්පත් ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.
8. **අයදුම්පත් 2025.03.05 දින හෝ එදිනට පෙර ලැබෙන සේ ඉදිරිපත් කළ යුතුය**

**(7) පොදු කොන්දේසි**

1. සෑම අයදුම්කරුවෙකුම ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු අතර දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සහ තනතුරේ රාජකාරි හොඳින් ඉටු කිරීමට ශාරීරිකව හා මානසිකව යෝග්‍ය විය යුතුය.
2. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන් සලකා බලනු නොලැබේ.
3. ඕනෑම ආකාරයකින් බලපෑම් කිරීම නුසුදුසුකමක් ලෙස සලකනු ලැබේ
4. බඳවා ගන්නා තනතුරු සංඛ්‍යාව , බඳවා ගැනීම කල්දැමීම/ අවලංගු කිරීම පිළිබඳව තීරණය කිරීමේ අයිතිය ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL) සතුවේ.
5. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL) නියාමන අධිකාරියක් වන අතර , කොමිෂන් සභාවේ සේවයට බඳවා ගන්නා ඕනෑම තැනැත්තකු විසින් ඔහුගේ / ඇයගේ කලත්‍රයා හෝ පවුලේ සාමාජිකයකු කොමිෂන් සභාවේ නියාමන පාලනයට යටත් වන ආයතනයක තනතුරකට පත් කිරීම හෝ රැකියාවක නිරත වීම උදෙසා සෘජුව හෝ වක්‍රව අනුබල දීම / දිරි ගැන්වීම / උපදෙස් දීම සිදු නොකළ යුතුය.

අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව
අංක 276
ඇල්විටිගල මාවත
කොළඹ 08